www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදය හා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය

## Socialism and the struggle against US militarism

**නික් බීම්ස් විසිනි**
**2007 මාර්තු 06**

*මාර්තු මුල් සතිය තුල සිඩ්නි හා නිව් කාසල් හි පැවති පලාත් මැතිවරන රැස්වීම්වල දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජික හා ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් වන නික් බීම්ස් විසින් ඉදිරිපත් කල වාර්තාව පහත පල කෙරේ. මෙම රැස්වීම් පවත්වනු ලැබුවේ මාර්තු 24 දින නිව් සවුත් වේල්ස් ප්‍රාන්ත මැතිවරනය තුල සසප මැදිහත් වීම ආරම්භ කරමිනි. ඉහල ව්‍යවස්ථාදායක සභාවට පක්ෂයෙන් ඉදිරිපත් කෙරෙන අපේක්ෂකයන් 15 ගේ නායකත්වය දරන්නේ බීම්ස් විසිනි.*

සසපය සිය මැතිවරන ව්‍යාපාරයේ හරි මැදට ගෙන ඇති යුද්ධයට එරෙහි අරගලය යටින් දිවෙන ඓතිහාසික වැදගත්කම පැහැදිලි කිරීම මෙම සන්ධ්‍යාවෙහි මාගේ කටයුත්තයි. සැබැවින්ම අප ජීවත්වන්නේ එලඹෙන දශකයන්හිදී මනුෂ්‍ය වර්ගයාගේ ඉරනම තීරනය වී ඇති අවධියක ය.

එක්සත් ජනපදයේ උපජනාධිපති සිය ඕස්ට්‍රේලියානු සංචාරය තුල දී කල සමහර ප්‍රකාශ සිහිපත් කරමින් ඇරඹීමට මට ඉඩ දෙන්න. මාර්තු දෙවෙනි දා චේනි සිය කථාව ආරම්භ කලේ සැප්තැම්බර් 11 ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගේ වැදගත්කම අවධාරනය කරමිනි.

"එතැන් පටන් අප, සතුරාගේ විශ්වාසයන් හා අභිලාෂයන්ගේ පරිමාවෙහි ස්වභාවය වටහා ගෙන ඇත්තෙමු" යයි ඔහු ප්‍රකාශ කලේ ය. එක්සත් ජනපදය සහ එහි මිතුරන් මුහුන දී සිටින්නේ ශිෂ්ඨ රටවල් තුල ව්‍යසනය හා විකාශය වැපිරීම අරමුනු කොට ගත් භූගෝලීය ව්‍යාපාරයකට ය. ත්‍රස්තවාදීන් ප්‍රායෝගිකව සියලු ලිබරල් දෘෂ්ටීන් සමග යුද්ධයකට, "ඔවුන්ට අනුව තමන් හැර අනෙක් සියල්ලන්ම බෙලහීනව සිටින" එලඹ සිටී යයි ඔහු අවධාරනය කලේ ය. වෙනත් වචනවලින් කිවහොත් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ගෙන යනු ලබන්නේ "ව්‍යසනය හා විනාශය" මගින් ගෝලීය ආඥාදායකත්වය වැනි දෙයක් ස්ථාපිත කිරීමට උත්සාහ දරන ව්‍යාපාරයකට එරෙහිව යි.

පනිවිඩය මග නොහැරෙන බවට වග බලාගනිමින් චේනි කියා සිටියේ "අධිරාජ්‍ය අභිලාෂයන් ඇත්තේ ඔවුන්ට එනම් ත්‍රස්තවාදීන්ට ය - පුලුල් මැදපෙරදිග රටක් බලය අල්ලා ගෙන, ඔවුන්ගේ ඉල්ලීම්වලට සවන් දීම ප්‍රතික්ෂේප කරන ආන්ඩුවලට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම සඳහා එය පදනම ලෙස යොදාගැනීමයි. ඔවුන් කෙලින්ම කියා සිටින පරිදි ඔවුන්ගේ අවසාන අරමුන, ස්පාඤ්ඤයේ සිට උතුරු ඇමරිකාව හරහා මැදපෙරදිග හා දකුනු ආසියාව ද අවසානයේ ඉන්දුනිසියාව දක්වා ම විහිදෙන කලාපය තුල ඉස්ලාමීය අධිරාජ්‍යයක් පිහිටුවා ගැනීම ය. එය එපමනකින් නතරවන්නේ ද නැත."

මෙම උමතු ප්‍රකාශ, ජර්මනියේ ඓතිහාසික දූතමෙහෙවර වනාහි යුදෙව්-බොල්ෂෙවික් කුමන්ත්‍රනයට එරෙහිව යුරෝපීය ශිෂ්ඨාචාරය රැකගැනීම යයි 1930 ගනන්වල කියා සිටි ඇඩොල්ෆ් හිට්ලර්ගේ වියරුවට නොදෙවෙනි ය.

සියල්ලට ම පලමුව චේනිගේ ප්‍රකාශ පිවිතුරු කුනු කසල ය. දේශීය බසින් නම් ගොමබෙටි ය.

නොඑසේ නම් ජනාධිපති ජිමී කාටර්ගේ හිටපු ආරක්ෂක උපදේශක ස්බිග්නිව් බ්‍රෙසෙන්ස්කි මැද පෙරදිග පුරා එක්සත් ජනපද මිලිටරි මැදිහත්වීම් උත්සන්න කිරීමේ අන්තරාය පිලිබඳ අනතුරු අඟවමින් සෙනේට් සභාවේ විදේශ සම්බන්ධතා කමිටුව හමුවේ දුන් සාක්ෂ්‍යයේ වචනවලින් කිවහොත් එය මෙසේ විය. "මෙවන් දිග් ගැස්සුනු හා ව්‍යාප්තවීමේ විභවයක් සහිත යුද්ධය සුජාත කිරීම සඳහා මිථ්‍යාමය ඓතිහාසික වෘතාන්තයක් දැනට මත් ප්‍රකාශයට පත් කෙරී තිබේ. ආරම්භයේ දී එය යුක්තිසහගත කලේ ඉරාකය තුල ජනඝාතක අවි තිබේ ය යන සාවද්‍ය ප්‍රකාශයන් මගිනි. යුද්ධය දැන් 'අපගේ කාලයේ තීරනාත්මක දෘෂ්ටිමය අරගලය' ලෙස යලි අර්ථ ගන්වා ඇත්තේ නාසිවාදය හා ස්ටැලින්වාදය සමග ඇති වූ පූර්ව ගැටුම් සිහිගන්වමිනි. එම සන්දර්භය තුල ඉස්ලාම් අන්තවාදය හා අල්කයිඩාව, නාසි ජර්මනිය හා ඉන් පසුව සෝවියට් රුසියාව විසින් එල්ල කල තර්ජනය හා සමාන වූ පරිද්දෙන් ඉදිරිපත් කරන අතර දෙවැනි ලෝක

සංග්‍රාමයට එක්සත් ජනපදයේ මැදිහත්වීම ඉක්මන් කල පර්ල් වරායට පහර දීම, සැප්තැම්බර් 11ට සමාන කරයි."

"මෙම අති සරල හා වාචාල වෘතාන්තය, නාසිවාදය පදනම් වූයේ කාර්මික අතින් යුරෝපයේ ඉතාමත් ම දියුනු රාජ්‍යයේ මිලිටරි ශක්තිය මතය යන කාරනයත්, ස්ටැලින්වාදයට මිලිටරිමය වසයෙන් බලවත් හා ජයග්‍රාහී සෝවියට් සංගමයේ සම්පත් මෙහෙයවීමේ හැකියාව පමනක් නොව සිය මාක්ස්වාදී ධර්මතාවය තුලින් ලෝක පරිමාන මතයක් පැවති බවත් අමතක කරයි. එයට පටහැනි ලෙස බොහෝ මුස්ලිම්වරුන් ඉස්ලාම් මූලධර්මවාදය වැලඳගෙන නැත. අල්කයිඩාව වනාහි හුදෙකලා ඉස්ලාමීය මුලාවකි. බොහෝ ඉරාකීයන් අරගලයක පැටලී ඇත්තේ ඇමරිකානු ආක්‍රමනික පාලනය ඉරාක රාජ්‍යය විනාශ කිරීම නිසා ය. ඒ අතර තුර ඉරානය, කලාපය තුල බලපෑම් සහිත තත්වයක් හිමි කර ගෙන ඇතත්, අභ්‍යන්තරිකව දේශපාලන වසයෙන් බෙදී ඇති අතර ආර්ථික හා මිලිටරිමය වසයෙන් දුබල ය. ඉරානය කේන්ද්‍ර කර ගත් පුලුල් ඉස්ලාමීය තර්ජනයක් සමග ඇමරිකාව දැනටමත් යුද්ධයක පැටලී ඇතැයි තර්ක කිරීම වනාහි ආත්ම තෘප්තියේ අනාවැකියක් ප්‍රචලිත කිරීමකි."

චේනිගේ වියරුව කෙරේ අවධානය යොමු කරන එකදු වාර්තාවක් කිසිදු ජනමාධ්‍යයක හෝ එක්සත් ජනපද විදේශ පිලිවෙතේ විවේචකයන් ලෙස පෙනී සිටින කිසිවෙකුගෙන් පල නොවීමත් කැපී පෙනෙයි.

එවන් බැරෑරුම් විමසුමක් නැත්තේ මක්නිසාද? ඒ ඇඩොල්ෆ් හිට්ලර් කෙනෙකුගේ සිතෙහි පහල වීමට තරම් අගනා වාතාවරනයක් මත, ලෝකයේ බලගතුම ජාතිය වන එක්සත් ජනපදයේ මධ්‍යම පිලිවෙත පදනම්ව තිබීමේ කාරනය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් කනස්සල්ලට හේතු වන බොහෝ ප්‍රශ්න මතුවීමේ හේතුව නිසා ය. ඒවායින් සමහරක් හෙලිපෙහෙලි කර ගැනීමට උත්සාහ කරමු.

මනෝචිකිත්සකයෙකු උමතුවේ සංසිද්ධිය පිරික්සා බලා එය වනාහි පතුලේ ඇති යථාර්ථයේ විකෘති පිලිබිඹුවක් බව සොයා ගැනීමට උත්සාහ කරන ආකාරයට ම චේනිගේ ප්‍රකාශයන් පරීක්ෂා කරන විට ඊනියා "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" සැබෑ ගාමක බලවේගයන් හෙලිපෙහෙලි වීමට පටන් ගනියි.

ඇඩොල්ෆ් හිට්ලර් සම්බන්ධ ප්‍රශ්නයේ දී යුදෙව් - බොල්ෂෙවික් කුමන්ත්‍රනය පිලිබඳ යාදින්න, නාසි පාලන තන්ත්‍රයේ විදේශ පිලිවෙතෙහි අරමුනු දෙකක් සඳහා කැපවූවකි. එක් අතකින් එය ආසන්න වසයෙන් බ්‍රිතාන්‍ය හා ප්‍රන්සය යන සිය පිලිමලුන්ට එරෙහි අරගලය ලෙස පෙනීගියත්, දිගු කාලයේ දී වෝල්වීදියට හා එක්සත් ජනපදයට එරෙහිව වූ අතර, අනෙක් අතින් සිය ගෝලීය පසමිතුරන්ට අභියෝග කල හැකි පදනමක් ලෙස සෝවියට් සංගමය ජයගෙන, නැගෙනහිර විවෘත කර ගැනීම මගින් ජර්මානු අධිරාජ්‍යවාදයට ලෙබන්ස්රොව් (හුස්ම ගතහැකි ඉඩක්) සපයාගැනීමේ තල්ලුව සඳහා විය.

ඒ ආකාරයට ම, බුෂ් පාලන තන්ත්‍රයේ සාමාජිකයන් විසින් බොහෝ අවස්ථාවල දී හඳුන්වනු ලබන ඉස්ලාම් අන්තවාදයට නොඑසේ නම් ඉස්ලාම් ෆැසිස්ට්වාදයට එරෙහි අරගලය ඉස්ලාමීය අධිරාජ්‍යයක් පිහිටුවීම වලක්වා බටහිර ශිෂ්ඨාචාරය, ආරක්ෂා කිරීම සඳහා කැප වූවකැයි කියා සිටීම එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ඉතා නිශ්චිත විදේශ පිලිවෙත් ආශක්තයන්ට සේවය කරයි. එය වනාහි එක්සත් ජනපදයේ ගෝලීය ආධිපත්‍යය පිහිටුවාලීම සඳහා වූ නිමක් නැති යුද්ධයේ දෘෂ්ටිමය ආවරනයයි.

චේනිගේ කථාව මෙය පැහැදිලි කරයි. මෙය වනාහි අනෙක් යුද්ධයන්ට වඩා වෙනස් හා අනෙකුත් යුද්ධයන් තුල වර්ධනය කල මූලෝපායන් සමග සටන්වැදිය නොහැකි යුද්ධයකැයි ඔහු අවධාරනය කලේ ය. "අඳුරේ සිට ක්‍රියාත්මක වන හා සමස්ත ලෝකය ම යුද පිටියක් ලෙස දැකගන්නා සතුරෙකු, ඇතුලත් කරගත හැකි හෝ නිවර්තනය කලහැකි අයෙක් නොවේ. වීරත්වයේ විචිත්‍ර සිහිනයන් තුල ජීවත්වන සතුරෙකු සාමකාමී සාකච්ඡාවන් සඳහා මේසයක වාඩිවන්නට යන්නේ නැත. අපගේ ආරක්ෂාව හා පැවැත්ම සඳහා අපට ඇති එකම විකල්පය වන්නේ ප්‍රහාරයට යෑම යි. සතුරා විනාශ කරන තෙක් තර්ජනයට සෘජුව ද, ඉවසීමෙන් හා ක්‍රමානුකූලව මුහුන දීමයි."

මානසික අසහනයේ ක්ෂේත්‍රයෙන් ඉවත්වීමට ප්‍රථම තවත් එක් ප්‍රකට සංසිද්ධියක් කෙරෙහි අවධානය යොමු කරමු. එනම් පුද්ගලයාගේ අභිප්‍රේරනයන් හා අභිනිවේෂයන්, වෙනත් තැනක පිලිබිඹුවන හා වෙනත් පුද්ගලයෙක් මත ආරෝපනය කල හැකි මනෝවිද්‍යාත්මක ප්‍රතිබිම්බනයකි. මෙහිදී අපට දැකගත හැකි පරිදි, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ කථිකයන්, ලෝකාධිපත්‍යය සඳහා වූ එක්සත් ජනපද මිලිටරිවාදයේ ම නිර්දය තල්ලුව ඉස්ලාමීය සතුරෙකු මතට කිසිදු සාකච්ඡාවකට ඉඩක් නැති, සාමකාමී යෝජනාවලින් තොර හා එකම විකල්පය ප්‍රහාරයකට යෑම ය යන යුද්ධයක් තුලින් විහිදුවාලයි.

## මැදපෙරදිග එක්සත් ජනපද මූලෝපාය

මනෝවිද්‍යාත්මක ක්ෂේත්‍රයෙන් පිටත, දේවල් පිහිටා ඇත්තේ කුමන ස්ථානයක ද? මෙහි දී යලිත් වතාවක් අපට චේනි වෙත යොමුවිය හැකිය. සිය කථාවේ දී ඉරානය ගැන සඳහන් නොකලත්, මාධ්‍යකරුවන් සමග සාකච්ඡාවල දී හෙලිදරව් වූයේ ඕස්ට්‍රේලියානු සංචාරය පුරාම ඔහුගේ සිත තුල එය හොල්මන් කල බවයි.

ඉරානයේ න්‍යෂ්ටික වැඩ පිලිවෙල හා ඊට සම්බන්ධ ප්‍රශ්න පිලිබඳව එරට සමග සාකච්ඡාවල ප්‍රගතිය ගැන ඇමරිකානු ඒබීසී මාධ්‍ය ජාලයේ වාර්තාකරුවෙකු විමසූ කල චේනි පහත සඳහන් විනිවිද පෙනෙනා ප්‍රකාශය කලේ ය.

"හොඳයි ඉරානයේ පිහිටීම සිහියට නඟන්න. මෙයට තල්ලුවක් දීම වැදගත් ය. මම මොහොතක් සිතා බලා න්‍යෂ්ටික ප්‍රශ්නය පසෙකින් තැබුවොත් ඉරානයේ භූගෝලීය පිහිටීම නියෝජනය කරන තත්වය බලන්න. ඔවුන් පර්සියන් ගල්ෆ් හි එක් පැත්තක්ම අරක් ගෙන සිටින අතර ලෝක තෙල් සැපයුමට කලහැකි බලපෑමේ පරිමාව, දෛනික නිෂ්පාදිතයෙන් සියයට 20ක් ම ගලායන්නේ හෝමුස් සමුද්‍රසන්ධිය හරහා ය යන කාරනයෙන් පැහැදිලි වෙයි."

චේනිගේ උපදේශය අනුව අප තව ටිකක් සහායවෙමින් මුලු මැදපෙරදිගම පරීක්ෂාවට භාජන කරමු.

2003 දී පිලියෙල කල ඔබ හමුවේ ඇති සිතියම (1) එක්සත් ජනපදයේ යුද කඳවුරු හා තෙල් බිම් ද, නල පද්ධතීන් ද අතර සම්බන්ධය පෙන්නුම් කරයි. එක්සත් ජනපදයේ ඇෆ්ගනිස්ථාන ආක්‍රමනයත්, ඉරාකය යටත් කිරීම හා ඉරානයට එරෙහිව සැලසුම් කල ප්‍රහාරයෙහිත් වැදගත්කම ඉන් පැහැදිලි කෙරෙයි. සමස්ත කලාපයේ ම සිය ආධිපත්‍යය සුරක්ෂිත කර ගැනීම සඳහා එක්සත් ජනපදය අඛන්ඩ ප්‍රහාරයක් ගෙන යාම මගින් ලෝකයේ විශාලතම තෙල් හා ස්වාභාවික ගෑස් සංචිතවල පාලනය අත් කර ගෙන සිටියි. මෙම න්‍යාය පත්‍රය ක්‍රියාවට නගන්නේ එතැනින්ම අවසාන කිරීමට නොව එක්සත් ජනපදයේ ගෝලීය ආධිපත්‍යය සහතික කර ගැනීමේ අවශ්‍යතාවය මත ය.

කෙසේ වුවද, ක්‍රියාවට නැගෙන මෙම මූලෝපාය නව ලෝක යුද්ධයක තර්ජනය ඉස්මතු කරයි.

පසු ගිය මාර්තුවේ දී පවත්වන ලද ආරක්ෂාව පිලිබඳ යුරෝපීය සමුලුවේ දී රුසියානු ජනාධිපති කල ප්‍රකාශයන් සැලකිල්ලට ගන්න. සමුලුවේ ව්‍යුහය, " වෙහෙස කර ආචාරශිලිත්වය හා ප්‍රසන්නවුවත් හිස් රාජ්‍යතාන්ත්‍රික භාෂාවෙන් වටරවුමක කථාකිරීමේ අවශ්‍යතාවය මගහැරීමට" තමන්ට ඉඩ ලබා දී ඇති බව පුටින් ආරම්භයේ දී ම පැහැදිලි කලේ ය. අනුෂාංගිකව "ජාත්‍යන්තර ආරක්ෂාව පිලිබඳ ගැටලු සම්බන්ධයෙන් මා සැබවින්ම සිතන්නේ කුමක් දැයි කීමට" ඔහුට අවස්ථාව සැලසී ය. එබැවින් අප එයට සවන්දීම වටනේය.

බලය, අධිකාරය හා තීරන ගැනීම එක් මධ්‍යස්ථානයක් මත පදනම් වූ ඊනියා ඒක ධ්‍රැවීය ලෝකය මුලුමනින් ම නොපිලිගතහැකි බව ඔහු කියා සිටියේ ය. "අත්තනෝමතික හා බොහෝවිට අනෛතික ක්‍රියාවන් කිසිදු ප්‍රශ්නයක් විසඳා ඇත්තේ නැත. තවද ඒවා, අලුත් මානව ඛේදවාචකයන්ට තුඩු දී ඇති අතර ආතතියේ නව මධ්‍යස්ථාන නිර්මානය කරයි.

"ලෝකය නිමක් නැති ගැටුම්වල අගාධයකට ඇද දමන බලය, එනම් මිලිටරි බලය ජාත්‍යන්තර සම්බන්ධතාවන්හි දී කිසි සේත් නොදැරිය හැකි තීව්‍රතාවයකින් යොදා ගන්නා ආකාරය අද අපි අත්දකින්නෙමු. මෙහි ප්‍රතිඵලයක් වසයෙන් මෙම කිසිදු ගැටලුවකට පුලුල් විසඳුමක් සොයාගැනීමේ දී අවශ්‍ය තරම් ශක්තිය අපට අහිමි වී තිබේ. දේශපාලන විසඳුමක් සොයාගැනීමට නොහැකිව තිබේ.... ජාත්‍යන්තර නීතියේ ප්‍රාථමික මූලධර්මයන් වඩ වඩාත් ලඝු කොට තැකීමක් අපි අත්දකිමින් සිටිමු.

"එක්සත් රාජ්‍යයක්... පලමුව හා ප්‍රමුඛව එක්සත් ජනපදය, සිය ජනතාව දේශ සීමා සෑම ආකාරයකින් ම උල්ලංඝනය කර තිබේ. වත්මන් ජාත්‍යන්තර සම්බන්ධතාවයන්හි දී, දේශපාලන වාතාවරනයේ පදනම මත දේශපාලන යෝග්‍යතාවේ ඊනියා ප්‍රශ්නවලට අනුව දී ඇති ගැටලුව විසඳීමේ ලොල් බව අප වඩ වඩාත් දකින්නෙමු.... මෙය අතිශයින්ම අන්තරායකාරී ය. මෙය, කිසිවෙකුටත් සුරක්ෂිත බවක් හැඟෙන්නේ නැති කාරනයට තුඩු දෙයි.... මක්නිසාද යත්, ජාත්‍යන්තර නීතිය මහා ගල් පවුරක් මෙන් තමන් ආරක්ෂා කරනු ඇතැයි කිසිවෙකුටත් හැඟෙන්නේ නැති බැවිනි. සැබැවින්ම එවන් ප්‍රතිපත්තියක් අවි තරගය උත්සන්න කරයි."

පුටින්ගේ විශ්ලේෂනයෙහි මවිත වීමට තරම් අමුතු යමක් ඇත්තේ නැත. ඔහු හුදෙක් සිතුවම් කරන්නේ එක්සත් ජනපද අත්තනෝමතිකත්වයේ ඇඟවුම් ය. නීති පැනවීමට බල කරන අනීතියේ වාතාවරනය තුල සෑම අයෙක්ම සිය ආසක්තතාවන්ගේ ආරක්ෂාව සඳහා ආයුධ සන්නද්ධ වීමේ පිහිට පතයි. කෙසේ වුවද මෙය නිශ්චිත තැනක දී ප්‍රධාන බලවතුන් අතර ගැටුමකට මුල පුරයි. පුටින්ගේ දෘෂ්ටීන්, එතරම් ම විවෘතව පල නොකලත් නිසැකව ම අනෙකුත් බොහෝ යුරෝපීය දේශපාලඥයන් ද බෙදාහදා ගනිති.

ඔහුගේ ඕස්ට්‍රේලියානු සංචාරයේ දී ඉරානය චේනිගේ සිත තුල පැවති එකම මාතෘකාව නොවී ය. චීනය මෑතක සිදු කල චන්ද්‍රිකා නාශක මිසයිල අත්හදා බැලීම හා "වේගවත් මිලිටරිකරනයක් පවත්වාගෙන යාම එහි "සාමකාමී නැගීසිටීම" යන අරමුනට අනුරූපී නොවන බව සඳහන් කරමින් ඔහු එල්ල කල යාන්තමින් සැඟවුනු තර්ජනය කැපීපෙනෙයි. ඊට අනුකූලව එක්සත් ජනපදය, ජපානය හා ඕස්ට්‍රේලියාව සම්බන්ධ වන ත්‍රෛපාර්ශවික ආරක්ෂක ව්‍යුහයක වැදගත්කම චේනි අවධාරනය කලේ නොවරදින සුලු ලෙස චීනයට එරෙහිව එල්ල කරමිනි.

මෙම වැඩෙන රනකාමීත්වය පිටුපස ඇත්තේ කුමක් ද? සෝවියට් සංගමය බිඳ වැටීමත් සමග දශක

එක හමාරකට පෙර, 21 වන සියවසට එක්සත් ජනපදය සඳහා නව මූලෝපායක් සැකසීමේ ලා චේනි ප්‍රධාන කොට ම යෙදී සිටියේ ය. ඔහු හා ඔහුගේ සහකරුවන් අවධාරනය කලේ, එක්සත් ජනපදයට ආර්ථිකව හෝ මිලිටරිමය වසයෙන් අභියෝග කල හැකි එක් බලයක් හෝ බල කන්ඩායමක නැගී ඒම වැලැක්වීම ප්‍රධාන ප්‍රශ්නය බවයි.

එතැන් පටන්, ආර්ථික භූගෝලීයකරන සන්තතිය සිතියම වෙනස් කොට තිබේ. සිදුවෙමින් පවතින්නේ කුමක් ද යන විෂයපථයට යොමු කෙරෙන එක් සංඛ්‍යා ලේඛනයක් ගෙනහැර දක්වීමට ඉඩ දෙන්න. පෙබරවාරි 7 දා ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රය වාර්තා කලේ, පසු ගිය වසර තුල චීනය, සිය බලශක්ති පද්ධතියට ගිගා වොට් 102 ක නව ධාරිතාවක් එක් කර ඇති බවයි. එය, ලෝක ආර්ථිකයේ ඉහල ම දහදෙනා අතරට ගැනෙන වෙන ම ගත් කැලිෆෝනියානු ප්‍රාන්තයේ මුලු ධාරිතාව මෙන් දෙගුනයකට සමාන ප්‍රමානයකි.

ප්‍රශ්නය මෙයයිඃ භූගෝලීය ධනේශ්වර ආර්ථිකයේ එම ව්‍යුහය තුල ම ඇතිවෙමින් තිබෙන දැවැන්ත වෙනස්කම්වල ප්‍රතිඵලය වන නව තත්වය සමග ප්‍රබල ම ධනේශ්වර බලවතා ලෙස එක්සත් ජනපදයට සාමකාමීව ප්‍රතිසංධානගත විය හැකි ද නැතහොත් පැරනි පර්යාය බිඳ දැමීමේ අර්ථය නව ගැටුම් හා ලෝක යුද්ධය පැන නැගීමේ හැකියාව ද?

## ඉතිහාසයේ පාඩම්

මෙම ප්‍රශ්නයට පිලිතුරු දිය හැක්කේ එය ඓතිහාසිකව සලකා බැලීමෙනි. පසු ගිය සියවස ආරම්භයේ දී හරියට ම කිව හොත් 1907 දී, දන් අපට කිව හැකි 19 වැනි සියවසේ අවසාන කාර්තුව තුල ඇති වූ භූගෝලීයකරනයේ ප්‍රථම අදියර මගින්, නිර්මානය කල නව තත්වයෙහි ඇඟවුම් සලකාබැලීම සඳහා සමාජවාදී ජාත්‍යන්තරය රැස්විය. ඊට පූර්ව අවධියේ දී මහා බ්‍රිතාන්‍යය එය සතුව පැවති ආර්ථික ශක්තියේ පදනම් මත හයිකාර ආර්ථික බලය ලෙස ක්‍රියාත්මක විය. එහෙත් පසුව තත්වය වෙනස් විය. යුරෝපා මහා ද්වීපය මත විශේෂයෙන් ම ජර්මනිය වැනි නව බලයන් මතුව ආවේ ය. නැගෙනහිරේ දී ජපානය ද බටහිර දී එක්සත් ජනපදය ද නැගී එමින් තිබුනි.

පැරනි සමතුලිතය බිඳ වැටුනු අතර ප්‍රධාන බලවතුන් අතර ගැටුම් වර්ධනය වීම දෙසට යොමු වූ සිදුවීම් මාලාවක් ඇති වෙමින් තිබුනි. 1907 කොන්ග්‍රස් යෝජනාව සඳහන් කලේ ධනේශ්වර රාජ්‍යයන් අතර යුද්ධ, වෙලඳපොලවල් හා ලාභ සඳහා වූ අරගලයේ ප්‍රතිඵලය වන බැවින් මිලිටරිවාදයට එරෙහි අරගලය සමාජවාදය සඳහා අරගලයෙන් නොවෙන් කල හැකි බවයි. යුද්ධය පුපුරා ගිය හොත්, එමගින් ජනිත කරන අර්බුදය, ජනතාව නැගිටුවා ලීම සඳහා උපයෝගි කර ගැනීමට සටන් වැදීම අවශ්‍ය කෙරෙන අතර එමගින් ධනේශ්වර පාලනයේ බිඳ වැටීම ඉක්මන් කරයි.

ඒ කාලයේ ම බ්‍රිතාන්‍ය විදේශ කාර්යාලයේ අභ්‍යන්තරය තුල ද යුද්ධය හා සාමය පිලිබඳ කාරනා සැලකිල්ලට භාජන විය. බ්‍රිතාන්‍ය ධනේශ්වරයේ සැලකිල්ලට බඳුන්වූ කරුනු අතර එකක් වූයේ ජර්මනියේ වේගවත් නැගීම හා "සූර්යයා තුල තැනක් (හිරු නොබසින අධිරාජ්‍යය -පරිවර්තක)" අත් කර ගැනීම සඳහා වූ එහි උත්සාහය යි. බ්‍රිතාන්‍ය හා එහි අධිරාජ්‍ය සම්බන්ධයෙන් මෙම වර්ධනයන්ගේ ඇඟවුම් කවරක් වී ද? ජර්මනිය අවධාරනය කලේ සිය ගෝලීය ප්‍රවිෂ්ටය ව්‍යාප්ත කිරීමෙහි ලා තමන්ට ඇත්තේ සාමකාමී අරමුනු පමනක් බවයි. එහෙත් බ්‍රිතාන්‍යයට එයින් සෑහීමකට පත්විය හැක්කේ කෙසේ ද?

අවසානයේ දී, බ්‍රිතාන්‍ය ආන්ඩුව තුල සිය ස්වාමීන් සඳහා ප්‍රධාන වාර්තාවක් පිලියෙල කල විදේශ කටයුතු කාර්යාලයේ ප්‍රධාන නිලධාරියෙක් වූ ඉයර් ක්‍රෝව්ට අනුව අරමුනු, අදාල වූයේ නැත. එය බ්‍රිතාන්‍ය දෘෂ්ටි ආස්ථානයෙන් ගත් කල ජර්මනිය සිය මිලිටරි ධාරිතාව පැතිරවීමට අදහස් කලේ ද නැතහොත් " සාමකාමී නැගීමක්" හා ජර්මන් සංස්කෘතියේ ප්‍රතිලාභ පැතිරවීම පිලිබඳව පමනක් සැලකිලිමත් වූයේ ද යන්න, අදාල නොවී යයි ඔහු ලිවී ය. අවසානයේ එහි බලපෑම එයට එනම් එහි ගෝලීය තත්වය ක්ෂය වී යාමට තුඩුදෙනු ඇත.

ජාත්‍යන්තර අර්බුද මාලාවකින් පසුව සත් වසක් අවසානයේ දී යුරෝපය තුල ප්‍රථම ලෝක සංග්‍රාමය පුපුරා ගියේ මිනිස් ඉතිහාසයේ කවර කලෙක වත් අත් නුදුටු විනාශකාරී රැල්ලක් මුදා හරිමිනි.

යුද්ධය කිසිවක් නොවිසඳූ අතර වර්සේල්ස් ගිවිසුම අත්සන් තබා යන්තම් දශක දෙකකට පසුව ලෝක සංග්‍රාමය ආරම්භ වී තිබුනි.

එක්සත් ජනපදයේ අනභියෝගී ආධිපත්‍යය නැගී ඒමත් සමග එය අවසාන විය. මෙම ආධිපත්‍යය පදනම් වූයේ එහි ඉහවහා ගිය ආර්ථික සුපිරි බලය මත ය. අවසාන විග්‍රහයේ දී සනාථ කරනු ලැබුවේ ලෝක ධනවාදය ස්ථායී කරමින් නව ආර්ථික සහ දේශපාලන සමතුලනයක් ගෙන ආ වඩාත්ම වැදගත් සාධකය මෙම ආර්ථික බලය බවයි.

සමතුලිතයක් ගැන අප කථා කරන විට එය ස්ථිතික සංසිද්ධියක් ලෙස සලකන්නේ යයි වටහා නොගත යුතු ය. ධනවාදයේ චාලක බලය වනාහි ලාභයේ සමුච්ඡය වීමයි. එය ආවේනිකව ම ගතික පද්ධතියකි. එබැවින්, භූගෝලීය ධනේශ්වර පර්යායේ විවිධ උපාංගයන්හි ප්‍රසාරනයට ඉඩකඩ සලසන කොන්දේසි මාලාවක් මත එය පදනම් විය යුතු ය. මාර්ෂල් සැලැස්ම හා 1930 ගනන්වල දී මුලුමනින්ම

පාහේ කඩා වැටුනු ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය ප්‍රතිනිර්මානය කිරීම වැනි ආරම්භකත්වයන් හරහා එම කොන්දේසි ස්ථාපනය කිරීමෙන් ලෝක ධනේශ්වරය ඉතිහාසය තුල තිරසාර වර්ධනයේ දීර්ඝතම අවධිය වන පශ්චාත් යුද්ධ උත්පාතය නිර්මානය කල හැකි විය.

කෙසේ වුව ද, ප්‍රධාන ධනේශ්වර බලවතුන් අතර සම්බන්ධතාවය වෙනස් කර ඇත්තේ ද එම වර්ධනය විසින් ම ය.

1930 ගනන් ආරම්භ වන විට ම එක්සත් ජනපදය යුද්ධයෙන් පසු ආසන්න කාල පරිච්ඡේදය තුල භුක්තිවිඳි ඉහවහා ගිය ආර්ථික ආධිපත්‍යය එයට අහිමිව ගොස් තිබුනි. 1940 ගනන් අවසානයේ දී ලෝක ආර්ථිකයේ තීරනාත්මක ගැටලුව වූයේ ලෝක මූල්‍ය පද්ධතිය ඇතුලත එක්සත් ජනපද ඩොලරයේ හිඟතාවය යි. 1960 ගනන් අවසානය වන විට ගැටලුව වූයේ ඩොලර් අතිරික්තයක් තිබීම යි. රන් අවුන්සයකට ඩොලර් 35 අනුපාතයකින් රන් සඳහා ඩොලර් හුවමාරු කිරීමේ සහතිකය මත පැවති ඩොලර් සඳහා වූ රන් පිටුබලය, 1971 අගෝස්තුවේ දී ජනාධිපති රිචඩ් නික්සන් විසින් අහෝසි කල විට ප්‍රශ්න එහි මුදුනට ම පැමිනියේ ය.

මීලඟ 20 වසර සනිටුහන් කලේ එක්සත් ජනපදයෙහි මග නොහැරිය හැකිවූ ආර්ථික පරිහානියක සලකුනුවලිනිඃ 1982-83 ආර්ථික පරිහානිය 1930 ගනන්වලට පසු ගැඹුරු ම එක විය. නිෂ්පාදන කර්මාන්ත රැසක ඇමරිකානු ආධිපත්‍යය ගිලිහී යාමඃ 1980 ගනන් අවසන් වන විට එක්සත් ජනපදය ලෝකයේ ප්‍රමුඛ නය හිමි රාජ්‍යයේ සිට ලෝකයේ ලොකු ම නයකරුවා බවට පත් වීමඃ 1929 ව්‍යසනයෙන් පසුව කොටස් වෙලඳපොලේ, 1987 සිදු වූ බරපතල ම කඩා වැටීම 1980 ගනන් අග සෝවියට් සංගමය බිඳ වැටීමෙන් සමුච්ඡය වී තිබූ මෙම සියලු ආර්ථික ගැටලු මතුපිටට ගෙන ආවේ ය. එය වෙනස් ලෙසකින් කිවහොත් ඒ සියල්ල දේශපාලන ක්ෂේත්‍රයට ගෙන ඒමට තුඩු දුන්නේ ය. සැබවින් ම, වහා ම පෙනී ගිය ආකාරය මෙසේ නොවී ය. සෝවියට් සංගමයේ බිඳ වැටීම අත්වැල් බැඳගත්තේ අප දුක ඇති ආකාරයට ධනවාදයේ හා වෙලඳපොලේ අවසන් ජයග්‍රහනය, ඉතිහාසයේ අවසානය හා එක්සත් ජනපදය අනභියෝගී ගෝලීය අධිපතියා හා සුපිරි බලවතා බවට පරිවර්තනය කලේ ය යන ප්‍රචාරක රැල්ලකි.

අප දැන් පසු ගිය 15 වසර දෙස ආපසු හැරී බලන්නේ නම් සිදුවීම්වල සැබෑ හේතූන් මතු වීමට පටන් ගනු ඇත. සෝවියට් සංගමයේ බිඳ වැටීම ධනවාදයේ ජයග්‍රහනය සලකුනු කරනවාට වඩා ප්‍රධාන ධනපති බලයන් අතර ගැටුම්වල නව අවධියක් විවෘත වීම සලකුනු කරයි. සිය ආර්ථික ආධිපත්‍ය අහිමි වී යාමේ අඩුව ජය ගැනීම සඳහා මිලිටරි බලය යොදාගැනීමට, සෝසසසං අවසානයට පත් වීමේ වාසිය ඩැහැ ගැනීම සඳහා එක්සත් ජනපදය මාන බලයි. 1990 ගනන්වල මිලිටරි ආක්‍රමනකාරිත්වය වැඩී යාමේ අර්ථය එය යි. ප්‍රථම ගල්ෆ් යුද්ධය, බොස්නියාව තුල මැදිහත් වීම, සර්බියාවට එරෙහි යුද්ධය, 2001 ඇෆ්ඝනිස්ථාන යුද්ධය හා ඉන් පසුව 2003 ඉරාක ආක්‍රමනය.

එහෙත් මෙය සිදුවෙමින් ඇති ක්‍රියාවලියකි. සාමකාමී ප්‍රතිඵලයක් ඇත්තේ නැත. එක් යුද්ධයක් නව ආක්‍රමනයක අවශ්‍යතාව වහා ම මතු කරයි. ඉරාකයේ සදාම් හුසේන් තන්ත්‍රය පෙරලාදැමීම ඉරානය ශක්තිමත් කර තිබේ. එබැවින් තව දුරටත් ඉරාකය යටත් කර ගෙන සිටීම පමනක් නොව, සියල්ලටත් වඩා ඉරානයේ "පාලන තන්ත්‍ර වෙනසක්" මගින් සමස්ත මැද පෙරදිග ම යලි හැඩ ගැන්වීම අවශ්‍ය කෙරෙයි.

මෙම උමතුව අවසන් කල හැක්කේ කෙසේ ද? නව ව්‍යසනයන් මාලාවකට ලෝකය ඇද වැටීමෙන් වලක්වා ගත හැක්කේ කෙසේ ද? න්‍යෂ්ටික අවි යොදාගැනීම වැලැක්විය හැක්කේ කෙසේ ද? ඉරානය සම්බන්ධයෙන් ගත් කල දැනට මත් මේසය මත තබා ඇති එක් විකල්පයක් වන්නේ එය යි. අරගලයක යෙදී සිටින සමස්ත මානව වර්ගයාගේ සැලකිල්ල යොමු වන ප්‍රශ්න මේවා ය. පිලිතුර සොයා ගැනීමේ ප්‍රථම පියවර වන්නේ අතීත අත්දැකීම්වල පාඩම් උකහා ගැනීම යි. පවත්නා සංවිධාන, පක්ෂ හා ආයතන තුලින් ඉදිරි මාවතක් වැටී නැත. ඉරාක යුද්ධයේ අත්දැකීම් දෙස බලන්න. එක්සත් ජනපදය ආක්‍රමනකාරි යුද්ධයක යෙදීම මගින් නියුරම්බර්ග්හි දී නාසි නායකයන්ට නඩු පවරා දඬුවම් දුන්නා වූ එම අපරාධ ම සිදු කර තිබෙන නමුත් එක්සත් ජාතීන් එම ආක්‍රමනකාරී යටත් කිරීමට අවසර දෙමින් යෝජනාවක් සම්මත කරයි. ප්‍රතිඵලය, ඉරානයට එරෙහිව එක්සත් ජනපදය යුද්ධයක් දියත් කිරීමේ හැකියාව යි. ඉරාකය තුල සිය හමුදාවන් ඉරානයේ සිට එල්ල කරන ප්‍රහාරයන්ට ලක් වී තිබීම නිසා ආත්මාරක්ෂාවට කටයුතු කිරීමේ පදනම මත එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ආරක්ෂා කරන බව කියා පාමින් එසේ කල හැක.

මම, ලෝකය පුරා සිටින ඊනියා වාම හා කම්කරු පක්ෂවල අත්දැකීම් විග්‍රහ කරන්නට යන්නේ නැත. එහෙත් සෑම තැනක දී ම එනම් එක්සත් ජනපදයේ ඩිමොක්‍රැටිකයන්, බ්‍රිතාන්‍යයේ ලේබර් පක්ෂය මෙරටේ ලේබර් පක්ෂය, ඉතාලියේ මධ්‍ය වාමාංශ සභාගය, ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් හා හරිතයන්, යන සියල්ලන් සම්බන්ධයෙන් චිත්‍රය එක ම ය. එක් අතකින් හෝ තවත් අතකින් මෙම සංවිධාන සියල්ල ම යුද්ධය පිටුපසින් ගාල් වී සිටිති.

කම්කරු පන්තිය නව මාවතක් සකසා ගත යුතු ය. අපගේ මැතිවරන ව්‍යාපාරයෙහි ප්‍රධාන පනිවිඩය

මෙයයි. එලඹෙන ඓතිහාසික කාල පරිච්ඡේදය තුල දී, ධනේශ්වර ක්‍රමය පෙරලා දැමීම මගින් යුද්ධය හා මිලිටරිවාදය අවසන් කිරීමටත්, සමාජවාදී රේඛා ඔස්සේ ලෝක ආර්ථිකය ප්‍රතිනිර්මානය කිරීමටත් කැප වූ නව ජාත්‍යන්තර සමාජවාදී පක්ෂයක් ගොඩ නැගීමේ කටයුත්ත ආරම්භ කල යුතු ය. එම කර්තව්‍යය භාර නොගත හොත් සමස්ත මනුෂ්‍ය වර්ගයා ම ව්‍යසනයකට මුහුන පානු ඇත. එම කර්තව්‍යය ආරම්භ කිරීමේ මාර්ගය වන්නේ අපගේ පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙහි විග්‍රහයන් කියවා අධ්‍යයනය කිරීමත් එහි ශාඛාවලට බැඳෙමින් එය ජාත්‍යන්තර කම්කරු පන්තියේ නව පක්ෂය ලෙස ගොඩනැගීමත් ය.

© www.wsws.org